# 21 බලයෙන් පිරිපුන් ජීවිත - දෙබොරා

පැරණි ගිවිසුමෙහි සඳහන් කාන්තා චරිත අතර සුවිශේෂ තැනක් ගන්නා දෙබොරා, විනිශ්චයකාරවරියක හා දිවැසිවරියක ලෙස ජනතාවට මඟපෙන්වූවා ය. ඉශ්රායෙල් ජනතාවගේ තීරණාත්මක මොහොතක තම ජාතිය බේරා ගැනීමට කැපවීමෙන් ක්‍රියා කළ දෙබොරාගේ චරිතය ගැන මෙම පාඩමේ දී විමසා බැලේ.

(තම මිතුරා ඉරුදින දේව මෙහෙයට නොපැමිණි බැවින් සිරිලක් ඒ පිළිබඳ ව සොයා බැලීමට නෙත්සරගේ නිවසට පැමිණෙයි. එම අවස්ථාවේ ඔවුන් අතර ඇති වූ දෙබස මෙලෙස විය.

සිරිලක් : ඇයි ඊයේ ඔයා දේව මෙහෙයටවත්, දහම් පාසලටවත් ආවේ නැත්තේ?

නෙත්සර : අසනීපයෙන් සිටිය නිසයි එන්න බැරි වුණේ. ඉතිං මොනවා ද ඊයේ දහම් පාසලේ දී සිද්ධ උණේ?

සිරිලක් : දන්නවා ද ඊයේ අපේ ළමා සමාජයේ නිලවරණය තිබුණානේ. කවුද දන්නවා ද සභාපති ලෙස පත් වුණේ?

නෙත්සර : දනුම මිනුම තරගයේ පළවෙනියා වුණ අයියා ද?

සිරිලක් : නැහැ, නැහැ නිම්තෙරා අක්කා තමයි පත් වුණේ.

නෙත්සර : වෙන කවුරුත් ම හිටියේ නැද්ද සභාපති වෙන්න. මට නම් හිතා ගන්නවත් බැහැ ඒ වාගේ කෙනෙකුට සමිතිය ඉදිරියට ගෙනියන්න පුළුවන් වෙයි ද කියලා. ඒ වාගේ තනතුරකට ගැළපෙන්නේ පිරිමි කෙනෙක් තමයි.

සිරිලක් : එහෙම කියන්න එපා, අද සමාජයේ විවිධ ක්ෂෙත්‍රවල කාන්තාවන් කී දෙනෙක් නායකත්වය අරන් කටයුතු කරනවා ද? අහලා නැද්ද තොටිල්ල පදවන අත රජකමට සුදුසුයි කියලා කියමනකුත් තියෙනවා.

අක්කා : අද විතරක් නෙමෙයි මල්ලි, අතීතයේ දීත් කාන්තාවන් තමන්ගේ රට යුද්ධවලින් පවා නිදහස් කරගෙන තියෙනවා.

නෙත්සර : ඒ කවුද අක්කේ?



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

අක්කා : ඇයි මල්ලි අහලා නැද්ද පරණ ගිවිසුමේ සඳහන් වන දෙබොරා කියන විනිශ්චයකාරවරිය ගැන. එයා තමයි දෙවියන් වහන්සේගේ මඟපෙන්වීමෙන් යුද්ධයෙන් රට නිදහස් කරගෙන තියෙන්නේ.

ඉහත දෙබසට අනුව දෙබොරා යනු විනිශ්චයකාරවරියක් බව ඔබට වැටහෙන්නට ඇත. දෙබොරා යනු පැරණි ගිවිසුමේ සඳහන් ප්‍රබල කාන්තා චරිතයකි. ඇය පිළිබඳ තොරතුරු ශුද්ධ බයිබලය ඇසුරෙන් දැන් අපි විමසා බලමු.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**විරාවලිය 4:1-3**

ඉශ්රායෙල් ජනතාවගේ වැරැදි ක්‍රියා කලාපය නිසා කානාන්හි රජ කළ ජාබීන් රජු හමුවේ යුධමය වශයෙන් ඔවුහු පරාජයට පත් වූහ. ජාබීන් රජුගේ සේනාවේ අධිපතියා වූයේ සිසේරා ය. ඔහු බොහෝ බලසම්පන්න පුද්ගලයෙක් විය. යකඩ රථ 900ක් ඔහු සතු වීමෙන් ඒ බව තහවුරු වේ.

විසි වසරක් පුරාවට යුද්ධයෙන් පීඩා විඳි ඉශ්‍රායෙල් ජනතාව තම පීඩා පිළිබඳ ව දෙවිපියාණන්ට මොර ගැසුවෝ ය. එසේ කළේ කායික ව හා මානසික ව දුර්වල මට්ටමක සිටි ඉශ්රායෙල්වරුන්ගේ එක ම පිළිසරණ දෙවියන් වහන්සේ බව ඔවුන් දැන සිටි බැවිනි. දෙවියන් වහන්සේ මෙවැනි යුධමය වතාවරණයක් තුළ ජනතාවට නිවැරැදි මාර්ගය පෙන්වීම සඳහා දෙබොරා නැමති විනිශ්චයකාරවරියක කැඳවූ සේක.

*"ඒ කාලයෙහි ඉශ්රායෙල්වරුන් විනිශ්චය කළේ ලප්පිදොත්ගේ බිරිඳ වූ දිවැසිවරියක වූ දෙබොරා තොමෝ ය."*

*විරාවලිය 4 : 4*

එදා සමාජය තුළ කාන්තාවන්ට නිසි පිළිගැනීමක් නොතිබුණි. එවැනි සමාජ පසුබිමක් තුළ දෙවියන් වහන්සේ නායකත්වය සඳහා කාන්තාවක කැඳවූ සේක. ඇය ජනතාව විනිශ්චය කිරීම සඳහා යොදා ගනු ලැබුවේ ඒප්‍රායිම් කඳු රටේ රාමාටත් බෙතෙල්ටත් අතර පිහිටි ඉඳි ගස පාමුල ස්ථානයකි. ඉශ්රායෙල් ජනතාව ඇගේ නායකත්වය පිළිගත්තෝ ය. එම නිසා ජනතාව උපදෙස් ලබාගැනීම සඳහා දෙබොරා වෙත පැමිණියෝ ය. ඔවුහු ඇයගේ හඬට සවන් දී තම ජීවිතවල අඩුපාඩු හඳුනාගෙන දේව කැමැත්ත ඉටු කිරීමට ඉදිරිපත් වූහ.



21.1 රූපය - දෙබොරා ඉඳිගස් යටට වී ජනතාව විනිශ්චය කරයි

විමසුමට
ශු. බයිබලයෙන්
විනිශ්චයකාරයෝ 4:6-8

පුරා වසර විස්සක කාලයක් යුද්ධයෙන් පීඩාවට පත් ජනතාවගේ එක ම බලාපොරොත්තුව වූයේ නිදහස් නිවහල් දේශයක ජීවත් වීම ය. ඒ වෙනුවෙන් දෙවියන් වහන්සේට මොර ගැසූ ජනතාවට සහනයක් ලබා දීම සිදු වන්නේ දෙබොරාගේ නායකත්වයෙනි. දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුව ඇය කෙදෙෂ් නප්තලියෙන් අබිනෝවම්ගේ පුත් බාරාක්ට සටනෙහි මූලිකත්වය පැවරුවා ය. කැඳවීම පිළිගත් ඔහු තව දුරටත් දෙබොරාගේ සහාය පැතී ය. ඒ අනුව දෙබොරා තම රට බේරා ගැනීමට බාරක්ට සහාය වීමට තීරණය කළා ය.

*"බාරාක් සාබුලොන් ද නප්තලීවරුන් ද*
*කෙදෙෂ්ට කැඳවා ගනු ලැබූහ. මිනිසුන්*
*දස දහසක් ඔහු කැටුව ගියෝ ය.*
*දෙබොරාත් ඔහු සමග ගියා ය"*

**විනිශ්චයකාරයෝ 4 : 10**

දෙබොරා දෙවියන් වහන්සේගේ මඟපෙන්වීමට අනුව සටන මෙහෙය වීමට බාරක්ට උපදෙස් දුන්නා ය. එපමණක් නොව සෘජු ලෙස එයට දායක වූවා ය.

*"එවිට දෙබොරා බාරාක් අමතා" නැගිටින්න මන්ද*
*සමිඳාණන් වහන්සේ සිසේරා ඔබ අතට පාවා දෙන*
*දවස මේ ය. සමිඳාණන් වහන්සේ ඔබට පෙරටුව*
*යන සේකැයි කීවා ය. එහෙයින් බාරාක් ද ඔහු අනුව*
*මිනිස්සු දසදහසක් ද තාබෝර් කන්දෙන් බැස ගියෝ ය"*

**විනිශ්චයකාරයෝ 4 : 14**

මෙලෙස දෙබොරා සෘජු ලෙස පෞද්ගලික ව මෙහෙයුමට සහභාගි වූවා පමණක් නොව සටන ජයගැනීමට අවශ්‍ය යුධ උපක්‍රම පිළිබඳ ව ද බාරාක් දැනුවත් කළා ය. එපමණක් නොව ඇගේ ආධ්‍යාත්මික ශක්තිය තුළින් අන් අය ද ධෛර්යවත් කළා ය. සමිඳාණන් වහන්සේ බාරාක්ට පෙරටුව, මෙම තීරණාත්මක අවස්ථාවේ වැඩ සිටින බව දෙබොරා දැනුම් දුන්නා ය. එමගින් බාරාක් අධ්‍යාත්මික ලෙස ශක්තිමත් කළා ය.

ඉශ්රායෙල් ජනතාව දෙවිපියාණන් වහන්සේගේ මඟ පෙන්වීම තුළ ක්‍රියා කරමින් සිසේරා පරාජය කළෝ ය. විසි වසරක් පුරා පැවති යුද්ධය නිමා විය. මෙම සටන දෙවි පියාණන්ගේ මඟපෙන්වීමට අනුව ජයග්‍රහණය කරා ළඟා වීමට පෙරමුණ ගත්තී විනිශ්චකාරවරියක වූ දෙබොරා ය. මෙලෙස දෙවි පියාණන් අපගේ ජීවිතවලට ද මඟපෙන්වන සේක.

දෙබොරාගේ චරිතය තුළින් කිතුනු අපට ලැබෙන මඟපෙන්වීම් මොනවා දැයි විමසා බලමු.

| | |
|---|---|
| 1. කාන්තා නායකත්වය සීමා වී තිබූ ජන සමාජයක දෙබොරා තම කැඳවීම පිළිගත්තා ය. → | විවිධ සමාජ පරිසරය තුළ අප ලබන කැඳවීම පිළිගැනීම |
| 2. දෙබොරා විසින් ලබා දුන් විනිශ්චයට අනුව බාරාක් තම කැඳවීම පිළිගැනීම → | විවධ පුද්ගලයන් තුළින් දෙවියන් වහන්සේ අපට කැඳවීම් ලබා දෙන බව |
| 3. තම මෙහෙය ඉටු කිරීමට දෙවි පියාණන්ගේ අනුග්‍රහය නිරන්තරයෙන් ලැබෙන බව දෙබොරා විශ්වාස කළා ය. → | සෑම කැඳවීමක් තුළින් ම දෙවි පියාණන් වහන්සේගේ මඟපෙන්වීම නිරන්තරයෙන් ලැබෙන බව |
| 4. බාරාක් සටන සිදු කිරීමට දෙබොරාගේ සහාය ඉල්ලූ විට ඇය සටනේ අවසානය දක්වා ඔහුට සහාය දැක්වූවා ය. → | අපගෙන් උපකාර බලාපොරොත්තු වන්නන්ට කාර්යය නිමා වන තෙක් උපරිම ලෙස සහාය දැක්වීම |
| 5. තම ජීවිත අවදානම පවා නොතකා කාන්තාවක ලෙස යුධ මෙහෙයුමට පූර්ණ ලෙස කැපවෙමින් උද්යෝගයෙන් ක්‍රියා කළා ය. → | පූර්ණ ලෙස කැප වෙමින් තම සේවය ඉටු කිරීම |
| 6. බාරාක්, දෙබොරාගේ වචනය විශ්වාස කරමින් ඇගේ උපදෙස් පිළිපැද්දේ ය. → | අන් අයගේ උපදෙස් දේව මඟපෙන්වීම තුළ පිළිගැනීම හා පිළිපැදීම |
| 7. දෙබොරා බාරාක් ධෛර්යවත් කිරීම ඔවුන්ගේ ජයග්‍රහණයට හේතු සාධක විය. → | තීරණාත්මක අවස්ථාවන්හි දී අන් අය ධෛර්යවත් කිරීමට ඉදිරිපත් වීම |

කාන්තාවන්ට හා ඔවුන්ගේ හැකියාවන්ට එතරම් පිළිගැනීමක් නොතිබුණු යුගයක දෙබොරා තම කැඳවීම තුළින් සමාජයට ඉටු කළ සේවය ඉමහත් ය. යාච්ඤාව හා දේව මඟපෙන්වීම තුළ දේව කැඳවීමට අනුව සමාජ මෙහෙවරෙහි යෙදීමේ වැදගත්කම දෙබොරා තුළින් අපට මැනැවින් පසක් කර දෙනු ලැබේ. මෙවන් අභියෝගාත්මක තීරණාත්මක අවස්ථාවන්හි දී එඩිතර ව, දේව මඟපෙන්වීම සොයමින් ඒවාට මුහුණ දීමට ඔබත් සූදානම් ද?

### ක්‍රියාකාරකම

1. තීරණාත්මක අවස්ථාවන්හි දී විවිධ සේවා සඳහා කැඳවන ලද වෙනත් කාන්තාවන් 3 දෙනෙකුගේ නම් ශුද්ධ බයිබලය ඇසුරෙන් සොයන්න.
2. දෙබොරාගේ නායකත්වයේ සුවිශේෂ ලක්ෂණ ජීවිතයේ ඔබට පැමිණෙන අභියෝගවල දී අදාළ කරගන්නේ කෙසේ ද?